# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1878/52 - 2014 සැප්තැම්බර් මස 05 වැනි සිකුරාදා - 2014.09.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ නාරම්මල ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම

පක්ෂ සාමාජිකයකුව සිටීම අවසන් වීම හේතු කොට ගෙන නාරම්මල ප්‍රාදේශීය සභාවේ සභික ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ තනතුර දැරූ සභිකයා වන ආර්. එස්. දිනපුර්ණ අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කරගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ නාරම්මල ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා දංගොල්ලේ ලේකමලාගේ තිලක් අජන්ත ලාල් කුමාර මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

නාරම්මල ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී තලංගම අප්පුහාමිලාගේ චමින්ද නාමල් තලංගම වන මම 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, දංගොල්ලේ ලේකමලාගේ තිලක් අජන්ත ලාල් කුමාර මහතා නාරම්මල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ඒ. සී. එන්. තලංගම,
තේරීම් භාර නිලධාරී,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

2014 සැප්තැම්බර් මස 03 වන දින,
මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

09 - 730

1A - G 20222 — 15 (2014/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*